# PAFFREL

නිදහස් හා සාධාරණ මැතිවරණයන් සඳහා ජනතා ක්‍රියාකාරිත්වය.

சுதந்திரமானதும் நியாயமானதுமான தேர்தல்களுக்கான மக்கள் செயற்பாடு.

**PEOPLE'S ACTION FOR FREE & FAIR ELECTIONS**

ජේ.ජේ. රත්නසිරි මහතා,
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 07

2019.09.25

මහත්මයාණෙනි,

**ජනාධිපතිවරණය කැඳවා ඇති මොහොතක රාජ්‍ය ආයතන සඳහා නිලධාරීන් පත් කිරීම.**

1. ජනාධිපතිවරණ ඡන්ද විමසීම සඳහා දින නියම කිරීමට ප්‍රථමව රාජ්‍ය ආයතන සතු උපකරණ, දේපල සහ මානව සම්පත මැතිවරණ ක්‍රියාකාරකම් සඳහා යොදා නොගැනීමට අවශ්‍ය පියවර ගන්නා ලෙස අමාත්‍යාංශ ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ වෙනත් වගකිව යුතු පාර්ශවයන් දැනුවත් කරන ලෙස 2019 අගෝස්තු 22 දාතමින් යුතුව ඔබතුමාගේ අවධානයට යොමු කරන ලදී.

2. රටක රාජ්‍ය නායකයා තෝරා ගැනීම සඳහා පවත්වනු ලබන ඡන්ද විමසීම අනෙකුත් මැතිවරණ වලට සාපේක්ෂව සුවිශේෂී වැදගත්කමක් උසුලයි. එම හේතුව නිසාම කිසිදු අපේක්ෂකයෙකුට අගතියක් හෝ සුවිශේෂී වාසියක් නොවන පරිදි කටයුතු කිරීම මැතිවරණ ක්‍රියාවලියට දායකවන සියලුදෙනාගේ ප්‍රමුඛ වගකීමක් වේ.

3. මැතිවරණ කාලසීමාව තුළ නිලධාරීන් බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීම, බඳවා ගැනීම්, උසස් වීම් හා ස්ථාන මාරු වීම් ලබාදීම නොකල යුතු බවට මැතිවරණ කොමිසමේ සභාපතිවරයා විසින් අවස්ථා ගණනාවකදීම චක්‍රලේඛ මගින් දැනුවත් කර ඇත.

4. නමුත් දෛනිකව දිවයිනේ බොහෝ පෙදෙස් වලින් නිලධාරීන් බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පවත්වන බවත් ඒ සඳහා පුහුණු වැඩසටහන් සම්මන්ත්‍රණ වැනි විවිධ උපක්‍රමශීලී ක්‍රියාමාර්ග භාවිතා කරන බවත් විවිධ මූලාශ්‍ර මගින් අප වෙත වාර්තා වී තිබේ.

5. මෙවැනි තත්වයන් හේතුවෙන් මැතිවරණයක පැවතිය යුතු සුජාත භාවයට කැළලක් වන අතරම දේශපාලන පක්ෂ වලට විවිධ සැකසංකා මතු කිරීමට අවැසි වටපිටාව නිර්මාණය කිරීමක් වන බව අමුතුවෙන් සඳහන් කල යුතු නොවේ. සියලු අපේක්ෂයන්ට අගතියකින් තොරව තරඟ වැදිය හැකි සම බිමක මැතිවරණය පැවැත්වීමට අවශ්‍ය වටපිටාව නිර්මාණය කිරීමට සහය වීම අප සැමගේම යුතුකමක් හා වගකීමක් බව විශ්වාස කරමු.

උක්ත කරුණ පිලිබඳව ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කර රාජ්‍ය ආයතන වල සිදුවන නිලධාරීන් බඳවා ගැනීම් සහ පත්වීම් ලබාදීම් වළක්වාලීම සඳහා සියලු අමාත්‍යාංශ ලේකම්වරුන් දෙපාර්තමේන්තු ප්‍රධානීන් දැනුවත් කිරීමට අවශ්‍ය කඩිනම් පියවර ගන්නා මෙන් කාරුණික ඉල්ලා සිටිමි.

මෙයට,
විශ්වාසී,

රෝහණ හෙට්ටිආරච්චි
විධායක අධ්‍යක්ෂක

පිටපත - මහින්ද දේශප්‍රිය මහතා, සභාපති, මැතිවරණ කොමිෂන් සභාව, රාජගිරිය
උනන්දුවක් දක්වන සෙසු ආයතන